135

දුර්ලභ

# මාක්ස්වාදී පරාරෝපණ සංකල්පය පිළිබඳ ඓතිහාසික , විවේචනාත්මක සහ තුලනාත්මක අධ්‍යයනයක්.

ජයන්ති සෙනෙවිරත්න ,

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ,

දර්ශන අංශය ,

කැලණිය විශ්වවිද්‍යාලය ,

කැලණිය.

දර්ශන විශාරද උපාධිය සඳහා ම විසින් කැලණිය විශ්වවිද්‍යාලය

වෙත ඉදිරිපත් කරන ලද පර්යේෂණ නිබන්ධය.

1991 අගෝස්තු

ප්‍රවේශ අංකය 135
... අංකය

## සාරාංශය

මාක්ස්වාදයේ නොයෙක් ක්ෂේත්‍ර අරබයා මෙතෙක් කෙරී තිබෙන්නාවූ පර්යේෂණ සම්භාරය දෙස බලනවිට සමකාලීන පාශ්චාත්‍ය දර්ශනය තුළ එයට අද්විතීය ස්ථානයක් හිමි වන බව කිව යුතුය. මෙහිලා අපගේ පර්යේෂණ අධ්‍යයනයට භාජනය වන පරාරෝපණ සංකල්පය, මාක්ස්වාදයේ අන් ක්ෂේත්‍ර තරමටම විවාදයට තුඩු දුන් එසේම ඉතාමත් වැදගත් දාර්ශනික සංකල්පයක් හැටියට සැලකීම යෝග්‍යය. මාක්ස්වාදී පරාරෝපණ සංකල්පයට ප්‍රවේශවීමට ප්‍රථම එකී සංකල්පයේ ඓතිහාසික ප්‍රභවය දෙස විමසුම් ඇසින් බලනවිට එහි බීජයන් ග්‍රීක දර්ශනය තුළ, වෙසෙසින් ප්ලේටෝගේ සහ ඇරිස්ටෝටල්ගේ දර්ශනයන්හිලා නිලීනව පවතින බව පැවැසීම වඩාත් නිවැරදිය. ප්ලතෝනික ක්‍රැටිලස් (Cratylus ) සංවාදය තුළද, ඇරිස්ටෝටලියානු අචල - චාලක (the Unmoved Mover ) සංකල්පය තුළද ඒ බව දැකිය හැකිවේ. එයිනිදු, ඇරිටෝටලියානු සංකල්පය තුළ නිලීනව පවත්නා පරාරෝපණ කාරකය සමකාලීන බටහිර පරාරෝපණ සංකල්පයේ වැඩීමෙහිලා මූලික වූ බීජය ලෙසට සැලකීම වඩාත් යෝග්‍ය වනු ඇත. විශ්වය තුළ අන්තර්ගත කුදු මහත් චරාචර සෑම වස්තුවක්ම ද්‍රව්‍යය ( matter ) සහ ආකෘතිය හෙවත් රූපය ( form ) යන ආකාරයෙන් පරිනාමයට පත්වන ආකාරයක් පිළිබඳව ඇරිස්ටෝටල් විසින් දේශනා කරනු ලැබ තිබේ. ඒවා එකින් එක වෙන්කළ හැකි නොවේ. මක්නිසාද යත්, ඒවා සාපේක්ෂකව පවත්නා හෙයිනි. එසේ වුවද, පරම කෝටියකට දියුණු වූ එමෙන්ම පරාරෝපණය වූ රූපයක් (Alienated form ) පිළිබඳව ද හෙතෙම අවධාරණය කරයි. අචල - චාලක යනුවෙන් සඳහන් කරන ලද්දේ එයයි. ඒ ආකාරයටම සමකාලීන හෙගලියානු දර්ශනය තුළද පැනෙන්නා වූ

පරම සංකල්පය ( the Concept of Absolute Spirit ) ද පරාරෝපණය වීමෙන් විශ්වය සහ ඊට අයත් විවිධ සංස්ථා ජනිත කරවන අයුරු තම දර්ශනය නිරූපනය කරයි.

(2) ඇරිස්ටෝටල්ගේ සිට හෙගල් දක්වා වූ පරාරෝපණ සංකල්පයේ විකාශනය දෙස බලනවිට එය හුදෙක් පාරභෞතික ස්වරූපයක් ගත්තා බව පෙනේ. එසේ වුවද එම සංකල්පය පාරභෞතිකවාදයෙන් මුදා ඊට පූර්ණ භෞතිකවාදී භාවිතයක් දීම පිළිබඳව ද, එය සදාචාරාත්මක මිනුම් දණ්ඩක වටිනාකමකින් යුත් භාවිතයක් කරා පළමුවෙන් යොමුකිරීම පිළිබඳව ද ගෞරවය හිමිවන්නේ මාක්ස්ට බව මෙහිලා පැවසීම වඩාත් යෝග්‍යය. මාක්ස් පරාරෝපණ සංකල්පයට දුන් භාවිතය හෙගලියානු සංකල්පය මෙන් අමරණීය ස්වරූපයක් ගත්තේ නැත. පාරභෞතිකවුද, අමරණීය වුද ආදී වශයෙන් හුදු චින්තනයට පමණක් සීමාව තිබූ පරාරෝපණ සංකල්පය ඉන් මුදවා මිනිසා සහ ශ්‍රමය පිළිබඳ භාවිතයකට මාක්ස් විසින් පරිවර්තනය කරන ලදී. ඒ අනුව ධනේශ්වර සමාජය තුළ මිනිසාගේ ඉරණම පැහැදිලි කර දීම සඳහා මාක්ස් පරාරෝපණ සංකල්පය ඉවහල් කරගත් බව කීම සාධාරණ වන අතර එහි අමරණීය ස්වරූපයක් නොමැති බවත් පන්ති රහිත සමාජයකදී එය අහෝසි වී යන - එසේම අහෝසි කළ හැකි තත්ත්වයක් බවත් පැහැදිලි කර දුන්නේය.

(3) පරාරෝපණයේ අහෝසිය නැතහොත් ක්ෂයවීම සම්බන්ධයෙන් මාක්ස් ඉදිරිපත් කළ විග්‍රහය බෙහෙවින් මතභේදයකට තුඩුදී තිබෙන්නකි.

සමකාලීන චින්තාවක් වන සාංදෘෂ්ටිකවාදයට අනුව පරාරෝපණය විලීනව නොයයි. එසේ නමුදු එය හෙගලියානු පැහැදිළි කර දීමට අනුව පාරභෞතිකවාදී අමරණීය ස්වරූපයක්ද ගන්නේ නැත. මිනිසා සහ සමාජය අතර පවතින්නාවූ සනාතනික ගැටුමෙහි ප්‍රතිඵලයක් ලෙස කුමන සමාජයක වුව පරාරෝපණීය මිනිස් සත්තාවන් දැකිය හැකිවේ. ඒ අනුව පරාරෝපණයේ මූලෝත්පාධනයකට වඩා එය සමනය කිරීමක් කෙරෙහි අවධානය යොමුකරන මුත් එකී සමනය වීම කුමන ආකාරයකට, කුමන පරිවර්තනීය කාල පරිච්ඡේදයකට අනුව, කුමන සමාජයක දැකිය හැකිද යන්න ප්‍රශ්නයක්ව පවතී. ඒ අනුව පරාරෝපණය යන්න හුදු දාර්ශනික ගැටලුවක වඩා මිනිසා විසින් ප්‍රායෝගික ජීවිතයේදී මුහුණ දෙන මනෝවිද්‍යාත්මක ගැටලුවක් ලෙස ඉදිරිපත් කිරීමට සාදෘෂ්ටිකවාදීහු **පෙළඹී සිටිති.** සාත්‍රේගේ ඉගැන්වීම් දෙස බලනවිට අපට වඩාත් ඒ බව ප්‍රත්‍යක්ෂ කරගත හැක.

(4) ඉහත දැක්වූ මූලික අවධාරණයට අනුකූලව ම විසින් කරනු ලැබූ අධ්‍යයනයෙහි අන්තර්ගතය පහත දැක්වෙන ආකාරයට පරිච්ඡේදගත සාරාංශයකට ගොනු කළ හැකිවේ.

මාක්ස්වාදී පරාරෝපණ සංකල්පය පිළිබඳ ඓතිහාසික,
විවේචනාත්මක සහ තුලනාත්මක අධ්‍යයනයක්

(1) පරාරෝපණ සංකල්පයේ ඓතිහාසික වර්ධනය පිළිබඳ මාක්ස්වාදී දෘෂ්ටිය විමසීම.

කැලණිය විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව
26 - 5 - 1997
පුස්තකාලය

මෙම පරිච්ඡේද යටතේ ම විසින් මුලින්ම පරාරෝපණය යනු කුමක්ද යන්න එහි මනෝවිද්‍යාත්මක ස්වරූපයද ආශ්‍රිත කොට ගෙන හඳුන්වා දෙන ලදී. අනතුරුව මිනිස් ශිෂ්ටාචාරය තුළ එය මතු වූ ආකාරය පිළිබඳව කෙරෙන මාක්ස්වාදී විග්‍රහයද, නූතන බටහිර දර්ශනය තුළ පරාරෝපණ සංකල්පයේ විකසිත වීම පිළිබඳව ද ඓතිහාසික දෘෂ්ටිකෝණයෙන් විමසා බලන ලදී.

(2) ඒ ඒ යුගවල ශ්‍රමයේ වටිනාකම සහ විභජනය තුළින් මතු වන ශ්‍රම පරාරෝපණය පිළිබඳ මාක්ස්වාදී දෘෂ්ටිය විමසා බැලීම

මෙහිලා මාගේ අවධානයට මූලික වශයෙන් යොමු වූයේ මිනිස් ශිෂ්ටාචාරය බිහිවීම කෙරෙහි බලපෑ ශ්‍රමයෙහි ඓතිහාසික ක්‍රියාකාරීත්වය පිළිබඳ මාක්ස්වාදී දෘෂ්ටිය විමසා බැලීම සඳහාය. අනතුරුව ශිෂ්ටාචාරයේ වැදගත් අවධියක් ලෙස ධනවාදී සමාජයෙහි ආරම්භය සඳහා ශ්‍රමය ඉටු කළ කාර්යභාරයද, කාර්මික ධනවාදය තුළ ශ්‍රමයේ ක්‍රියාකාරීත්වය සහ එහි පරාරෝපණය පිළිබඳ කෙරෙන්නාවූ මාක්ස්වාදී විග්‍රහයද ම විසින් විමර්ශණයට භාජනය කරන ලදී.

(3) ශ්‍රම පරාරෝපණයෙන් මතු වූ ආර්ථික පරාරෝපණය පිළිබඳ මාක්ස්වාදී දෘෂ්ටිය විමසා බැලීම

මෙම පරිච්ඡේදය තුළින් මා බලාපොරොත්තු වූයේ ධනවාදී ආර්ථික රටාව ශ්‍රමිකයාගේ පැවැත්මට එරෙහි වන ආකාරයත්, එකී රටාව තුළ පැනෙන විෂම ලක්ෂණ පිළිබඳවත් කෙරෙන මාක්ස්වාදී විග්‍රහය විමසා බැලීමටය. ධනවාදය තුළ පැනෙන ප්‍රතිවිරෝධතා

පිළිබඳවත්, එහි නව ප්‍රවනතාවයක් ලෙස අධිරාජ්‍යවාදය තම්වූ අවධිය කරා වර්ධනය වීමත් ගැන කෙරෙන්නාවූ ලෙනින්වාදී ආකල්පයද මෙහිලා ම විසින් පරිශීලනය කරන ලදී.

(4) ආර්ථික පරාරෝපණයෙන් මතුවන සමාජයීය පරාරෝපණය පිළිබඳව කෙරෙන මාක්ස්වාදී දෘෂ්ටිය විමසා බැලීම.

සමාජයීය පරාරෝපණය යටතේ ධනවාදී සමාජය තුළ පාරිභෝගිකයාගේ පරාරෝපණයද, විද්‍යාව සහ නවීන තාක්ෂණය හේතුවෙන් සිදුවූ යාන්ත්‍රිකරණය හේතුකොටගෙන පැන නැගෙන්නාවූ මිනිසා ගේ පරාරෝපණීය ලක්ෂණද මෙම පරිච්ඡේදය තුළ මවිසින් විමසා බලන ලදී. ඒ අනුව මෙහිලා විශේෂයෙන් මිනිසා පරිසරයෙන් පරාරෝපණය වීම පිළිබඳවත්, ධනවාදී සමාජය තුළ කාන්තාවගේ ඉරණම පිළිබඳවත් කෙරෙන මාක්ස්වාදී විග්‍රහයට මූලික අවධානය යොමු කරන ලදී.

(5) මාක්ස්වාදී පරාරෝපණ සංකල්පය පිළිබඳ සමකාලීන සාංදෘෂ්ටිකවාදී මතය තුලනාත්මකව විමසා බැලීම

මෙහිලා මුලින්ම පරාරෝපණය පිළිබඳ සාංදෘෂ්ටිකවාදී ආකල්පය විමසා බලන අතර විශේෂයෙන් සාත්‍රේගේ ඉගැන්වීම් කෙරෙහි අවධානය යොමුකරනු ලැබේ. පරාරෝපණයෙන් මිදීම හෙවත් ' ගැලවීමේ මග ' පිළිබඳව පැනෙන මාක්ස්වාදී විසංවාදයද, සාත්‍රේ සහ මාක්ස්වාදය අතර පවතින මූලික වෙනස්කම් පිළිබඳවද කෙරෙන තුලනාත්මක අධ්‍යයනයක් මෙහිලා ම විසින් කරනු ලැබ තිබේ.

(6) නිගමනය

මෙම පරිච්ඡේදය තුළ මාක්ස්වාදී විසංවාදය පැහැදිලි කරමින් පරාරෝපණයෙන් මිනිසාට ගැලවිය හැකි ද යන කාරණය විමර්ශනයට භාජනය කරනු ලැබීය. මෙම විමර්ශනයෙහිලා මිනිස් ස්වභාවය පිළිබඳවත්, මාක්ස්වාදී භෞතිකවාදී දෘෂ්ටිය , එකී මිනිස් ස්වභාවය විග්‍රහ කිරීමේදී, කොතෙක්දුරට අර්ථසම්පන්න වී ඇත්ද යන්නත් සොයා බලනු ලැබ අවසානයේදී ඒ පිළිබඳ මාගේ නිගමනය ඉදිරිපත් කරනු ලැබ තිබේ.